**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2016 අගෝස්තු

# BUDDHIST CULTURE - I / බෞද්ධ සංස්කෘතිය I - (BCG-1)
(නිර්දිෂ්ට ග්‍රන්ථ)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)
(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

1. ''ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ මේ කියන නිත්‍ය වූ දානය මහා යාග දානයට වඩා මහත් පල මහානිසංස වන්නේ කෙසේද? '' යන කූටදන්ත බමුණාගේ පැනයට ප්‍රතිචාර ලෙස බුදුන් වහන්සේ දුන් පිළිතුර පරික්ෂා කරන්න.

2. කූටදන්ත සූත්‍ර ධර්මය තුළ විභාග වන උදාර පැවිදි දිවිය පිළිබඳ විමසුමක් කරන්න.

3. "විශ්වයේ ප්‍රභවයත් සමාජ පරිණාමයත් ආකස්මික සංසිද්ධියක් නොවේ"අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් පරික්ෂා කරන්න.

4. අග්ගඤ්ඤ සූත්‍රය තුළ දැක්වෙන අන්‍ය ශ්‍රමණ වාද පරික්ෂා කොට ඒවා බුදු සමයෙන් ප්‍රතික්ෂේප වන ආකාරය විමසන්න.

5. ආදර්ශ සම්පන්න භික්ෂු ජීවන ප්‍රතිපදාවක් ගොඩනැංවීම සඳහා කකචූපම සූත්‍රයේ අගය පරික්ෂා කරන්න.

6. කෝපයෙහි ආදීනව හා මෛත්‍රියෙහි ආනිසංස බුදු සමය විභාග කරන ආකාරය කකචූපම සූත්‍රය ඇසුරින් විමසන්න.

අනෙක් පිටුවට ...

7. බෞද්ධ විමුක්ති මාර්ගයේ සුවිශේෂත්වය සන්දක සූත්‍රය ඇසුරින් විමසන්න.

8. තර්කය හා වීමංසනය බෞද්ධ විමුක්ති වාදයේ අත්‍යවශ්‍ය අංග ලෙස සැලකිය හැකිද? විමසන්න.

9. සුඛාවතීව්‍යුහ සූත්‍රයෙහි දැක්වෙන 'බෝධිසත්ව සංකල්පය' භක්තිවාද මාර්ගයක් වෙනුවෙන් නිර්මාණය කළ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිද? විමසන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරින් <u>හතරක්</u> සඳහා කෙටි සටහන් ලියන්න.

    අ. අස්සදම්මසාරථී

    ආ. කකචූපම උපමාව

    ඇ. ආභස්සරසත්තා

    ඈ. සුඛාවතී ලෝකධාතුව

    ඉ. දානය හා විමුක්තිය

==========

# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2016
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2016

BUDDHIST CULTURE -II / බෞද්ධ සංස්කෘතිය II - BCG-2
(බෞද්ධ ආචාර්යවාද)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)
(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

1. බෞද්ධ නිකායාන්තරයන්හි ප්‍රභවය පිළිබඳ පවතින විවිධ මත සාකච්ඡා කරන්න.

2. ශාසන ඉතිහාසයෙහි මහා සංඝික නිකාය පහළවීමට තුඩුදුන් හේතු කවරේදැයි පැහැදිලි කරන්න.

3. සර්වාස්තිවාදී නිකායේ ආරම්භය හා විකාශය පිළිබඳව දැක්වෙන මත විමසන්න.

4. සර්වාස්තිවාදීන්ගේ "ධර්ම" සංකල්පය හා ථේරවාදීන්ගේ "ධම්ම" සංකල්පය සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

5. සෞත්‍රාන්තික දර්ශනයේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

6. යෝගාචාර දර්ශනයේ මූලික ඉගැන්වීම් අනෙකුත් සම්ප්‍රදායන්හි ඉගැන්වීම්වලින් වෙනස් වන්නේ කිනම් අයුරින්දැයි පරීක්ෂා කරන්න.

7. නාගර්ජුන හිමියන් විසින් ශූන්‍යතා ධර්මය තහවුරු කරන ආකාරය පරීක්ෂාකරන්න.

8. විඤ්ඤාණය පිළිබඳ මුල්බුදුසමයේ ඉගැන්වීම් පැහැදිලිකොට එම සංකල්පය කුමන ආකාරවලින් විඥානවාද සම්ප්‍රදායේ වර්ධනය වී ගියේදැයි පෙන්වා දෙන්න.

9. ථේරවාදය හා මහායානය අතර ඇති මූලික වෙනස්කම් කවරේදැයි පරීක්ෂාකරන්න.

10. ථේරවාදී අනත්ත සහ මහායානික අනාත්ම සංකල්පය අතර සම විෂමතා ඇත්දැයි පරීක්ෂා කරන්න.

==============

UNIVERSITY OF PERADENIYA

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2016

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2016 අගෝස්තු

# BUDDHIST CULTURE - III / බෞද්ධ සංස්කෘතිය 3 - ( BCG - 3)

## (ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය)

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න

(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

1. ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනය කිරීමේදි උපයෝගි කරගත හැකි මූලාශ්‍ර හඳුන්වාදී ඒවායින් ලැබෙන පිටුවහල විමසන්න.

2. ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව පැවැති ඇදැහිලි පිළිබඳ විස්තරයක් මහාවංසය ආශ්‍රයෙන් සපයන්න.

3. මහින්දාගමනයට පෙර ලක්වැසියන් බුදුසමය ගැන දැන සිටි බවට ඉදිරිපත් කළ හැකි සාධක විචාරාත්මකව විමසන්න.

4. මිහිඳු හිමියන් ලක්වැසියන්ට ධර්ම දේශනා කිරීමට තෝරාගත් මාතෘකා තත්කාලීන ජන ජීවිතයට කොතෙක් දුරට අදාළ වන්නේ දැයි විමසන්න.

5. මෙරට ආජ්‍ය පාලනය කෙරෙහි බලපෑ බෞද්ධ ඉගැන්වීම් හඳුන්වා දෙන්න.

6. සිංහල සාහිත්‍යයේ ප්‍රගමනයට බුදුසමයෙන් ලද අනුග්‍රහය පිරික්සන්න.

7. ශ්‍රී ලාංකේය සංස්කෘතිය කෙරෙහි බලපෑ මහායාන සංස්කෘතිකාංග පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ...

8. පොළොන්නරු කතිකාවත ආශ්‍රයෙන් එ කල ආරාමික ජීවිතයේ පරිහාණිය කෙබඳුවී දැයි යන්න පිරික්සන්න.

9. I වන විජයබාහු රජතුමාගේ ශාසනික සේවය අගය කරන්න.

10. ලංකාවේ බෞද්ධ ස්තූපයේ විකාශය සැකෙවින් දක්වන්න.

==========